40260

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

# බෞද්ධ ශිෂ්ටාචාරය I
# பௌத்த நாகரிகம் I
# Buddhist Civilization I

45 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

1. වෛදික චින්තනයට අනුව කාමයෙහි නො ඇලී කටයුතු කිරීම ස්වධර්මයක් වන්නේ,
(1) බ්‍රාහ්මණයන්ට ය. (2) ක්ෂත්‍රියයන්ට ය.
(3) වෛශ්‍යයන්ට ය. (4) ශුද්‍රයන්ට ය.
(5) මුනිවරුන්ට ය.

2. ඒ ඒ වර්ණවලට අයත් කාර්ය නියම කරනු ලබන බ්‍රාහ්මණික ඉගැන්වීම හැඳින්වෙන්නේ,
(1) වර්ණධර්ම නමිනි. (2) ආශ්‍රමධර්ම නමිනි.
(3) ස්වධර්ම නමිනි. (4) ආපද්ධර්ම නමිනි.
(5) නියාමධර්ම නමිනි.

3. සත්ත්වයා හා ලෝකය පිළිබඳ විවිධ ආගමික අදහස් බුද්ධකාලීන භාරතීය සමාජය තුළ ගොඩ නැගී තිබුණි. ඒවා නියතිවාදී, පුබ්බේකතහේතුවාදී, අහේතුඅප්පච්චයවාදී, උච්ඡේදවාදී, බහුපදර්ථවාදී වැනි නම්වලින් හඳුන්වා ඇත. මේ අතර සත්ත්වයා හා ලෝකය මවා පාලනය කරන විශ්ව බලයකින් සමාජය ප්‍රභවය වූ බව ද පිළිගැණිනි. ආගමික දේශපාලනික, ආර්ථික, ගෘහස්ථ ආදී සමාජ සංස්ථා නිර්මාණය වූයේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පිළිගැනීමට පදනම් වී ඇත්තේ,
(1) හේතුඵලවාදයයි. (2) පුබ්බේකතහේතුවාදයයි.
(3) නියතිවාදයයි. (4) අහේතුඅප්පච්චයවාදයයි.
(5) ඉස්සරනිම්මාණවාදයයි.

4. දිනක් අජාසත් රජතුමා එක් ප්‍රකට ශාස්තෘවරයකු වෙත ගොස් මේ ආත්මභාවයේ දී ම අත්දැකිය හැකි ශ්‍රමණ ඵලයක් දැක්විය හැකි දැයි විමසන ලදුව "පරලොවක් ඇද්දැයි මගෙන් විමසුවහොත් පරලොවක් ඇතැයි මට අදහස් වී නම් පරලොවක් ඇතැයි මම කියමි. එහෙත් එබඳු ම අදහසක් මට නැත. පරලොවක් නැතැයි යන අදහසක් ද මට නැත. අන් පරිද්දකිනුත් මගේ අදහසක් නැත." යනාදී වශයෙන් පරලොව ජීවිතය, කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක, මරණින් මතු සත්ත්වයාගේ පැවැත්ම වැනි තේමා පිළිබඳ ව අවිනිශ්චිත පිළිතුරක් ප්‍රකාශ කළ බව දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැක්වේ.
ඉහත දැක්වූ දර්ශනික ආකල්පය දරූ ශාස්තෘවරයා වූයේ,
(1) පූරණකස්සප ය. (2) මක්ඛලීගෝසාල ය.
(3) සංජයබෙල්ලට්ඨිපුත්ත ය. (4) පකුධකච්චායන ය.
(5) අජිතකේසකම්බිලි ය.

5. පූර්ව වෛදික යුගයේ දී භාරතීය සමාජය තුළ කාන්තාවට ප්‍රමාණවත් ආගමික නිදහසක් හිමි ව පැවැති බවට සාධක දැකිය හැකි වුව ද බ්‍රාහ්මණ යුගයේ දී එම නිදහස මුළුමනින් ම අහිමි වූ බවක් දක්නට ලැබේ. එසේ වුව ද බුදුසමයෙන් කාන්තාවන්ට පූර්ණ ආගමික නිදහසක් ප්‍රදානය කොට ඇති බව සනාථ වන්නේ,
(1) බුදු සසුනේ කාන්තා පැවිද්දට ඉඩ ලබා දීමෙනි.
(2) නිවසේ ආධිපත්‍යය බිරිඳට ලබා දීමෙනි.
(3) ස්වාමියාට හා බිරිඳට සාමාජික වශයෙන් සමාන ව කටයුතු කිරීමට අවකාශ ලබා දීමෙනි.
(4) රජුන් පවා තනන මව බෞද්ධ සාහිත්‍යය තුළ උසස් ලෙස අගය කොට තිබීමෙනි.
(5) මවක් වශයෙන් කාන්තාව බුදුසමය තුළ පූජනීයත්වයට පත් කොට තිබීමෙනි.

[ දෙවෙනි පිටුව බලන්න.

6. ශ්‍රමණ සම්ප්‍රදායය බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙන් වෙනස් වන මූලික ලක්ෂණයකි,
(1) ඥානමාර්ගය නො පිළිගැනීම
(2) ශුද්ධ වූ ආගමික ග්‍රන්ථ ප්‍රාමාණිකත්වයෙන් නො පිළිගැනීම
(3) අනීශ්වරවාදය නො පිළිගැනීම
(4) අත්තකිලමථානුයෝගය නො පිළිගැනීම
(5) අනගාරික ප්‍රතිපදාව නො පිළිගැනීම

7. බුද්ධකාලීන භාරතය ජනපද දහසයකට බෙදී තිබුණි. මේවායින් සමහරක් ගණ තන්ත්‍ර රාජ්‍ය වූ අතර මගධ, කෝසල, වත්ස, අවන්ති යන රාජ්‍යවල රාජාණ්ඩු ක්‍රියාත්මක විය. මෙම රාජාණ්ඩු අතුරෙන් අවන්ති රාජ්‍යයේ බුද්ධකාලීන පාලකයා වූයේ,
(1) පසේනදී කෝසල රජු ය. (2) සේනිය බිම්බිසාර රජු ය. (3) අජාසත් රජු ය.
(4) උදේන රජු ය. (5) චණ්ඩපජ්ජෝත රජු ය.

8. 'සමාජ ප්‍රභවය' පිළිබඳ බ්‍රාහ්මණ චින්තනය වූ දේවනිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන බුදුසමය, සාමාජික, ආර්ථික, දේශපාලනික, පාරිසරික හා මනෝමූලික ආදී විවිධ සාධක පදනම් කොට ගෙන හේතුඵලවාදී ව සමාජ පරිණාමය සිදු වූ බව අග්ගඤ්ඤ සූත්‍රයේ දී පෙන්වා දෙයි. ඒ අනුව රාජ්‍යයේ ප්‍රභවය සිදු වූයේ,
(1) කර්ම විපාක සිද්ධාන්තයේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) පාරම්පරික උරුමයේ හිමිකම අනුව ය.
(3) දේවනිර්මාණවාදය ප්‍රතික්ෂේප කිරීමෙනි.
(4) මහජන සම්මුතියේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) මහජන උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වශයෙනි.

9. ඊශ්වරනිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්පච්චයවාදය යනාදී ඉගැන්වීම්වලට සාපේක්ෂ ව බුදුසමය, හොඳ - නරක තෝරා බේරා ගෙන කටයුතු කිරීමට පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් ඇතැයි ද යම් ක්‍රියාවක් ආරම්භ කිරීමටත්, නො කඩවා පවත්වා ගෙන යාමටත්, බාධා ජය ගැනීමටත් හැකියාව ඇතැයි ද අවධාරණය කරයි. මෙමගින් තහවුරු වන්නේ බුදුසමය,
(1) පුද්ගල නිරවද්‍යතාව පිළිගන්නා බව ය. (2) පුද්ගල ශක්‍යතාව පිළිගන්නා බව ය.
(3) පුද්ගල අනන්‍යතාව පිළිගන්නා බව ය. (4) පුද්ගල අර්ථ සිද්ධිය පිළිගන්නා බව ය.
(5) පුද්ගල ඒකාබද්ධතාව පිළිගන්නා බව ය.

10. මහාවිජිත නම් රජුගේ පුරෝහිත බමුණා රජුට මෙසේ පැහැකර සිටියේ ය.
"මහරජතුමනි, ඔබ වහන්සේගේ රට සොර උවදුරින් පීඩිතුනේ ය. ගම් නියම්ගම්වල මං පැහැරීම් දක්නා ලැබේ. රජතුමා මෙවන් රටකින් බදු අය කරන්නේ නම් එයින් නො කටයුත්තක් කරන්නේ ය. වධ දීමෙන්, බැඳලීමෙන්, දඩ ගැසීමෙන්, හිස මුඩු කිරීමෙන්, ගැරහීමෙන්, රටින් පිටමං කිරීමෙන් සොරමුළ (දස්සුඛීලය) මුලින් ම උදුරා දමමියි ඔබට සිතෙන්නේ නම් එසේ කිරීමෙන් සොරමුළ මැනවින් ඉදිරීමක් නො වන්නේ මැයි."
දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ දැක්වෙන මේ ප්‍රකාශයට අනුව රටක පවත්නා මෙබඳු අර්බුදයක් විසඳගැනීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන දේශපාලන ක්‍රමෝපාය ලෙස දක්වෙන්නේ,
(1) රාජ්‍ය අයබදු නො ගෙන සිටීම ය.
(2) නීති රීති දැඩි කිරීම ය.
(3) දුරාචාරවල නො යෙදෙන ලෙසට උපදෙස් ලබාදීම ය.
(4) දිළින්දන්ට ධනය බෙදා දීම ය.
(5) ජනතාවගේ ආර්ථික ශක්තිය දියුණු කිරීම පිණිස නිසි විධිවිධාන යෙදීම ය.

11. "ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූලධර්ම රැකගනිමින් පාලන කටයුතු සිදු කිරීමෙන් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේ ය" යනු බුදුසමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) සතර සංග්‍රහවස්තුවයි. (2) පංච ශීල ප්‍රතිපදාවයි.
(3) සප්ත අපරිහානීය ධර්මයයි. (4) දස රාජ ධර්මයයි.
(5) දස සක්විතිවතයි.

12. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනු බුදුසමය විසින් පිළිගන්නා පරමාදර්ශී සිවුවණක් පිරිසයි. මෙම පිරිස අතුරෙන් "සාවක සංඝ" නමින් හැඳින්වෙන පිරිසට අයත් ආර්ය ශ්‍රාවකයෝ,
(1) භික්ෂු සංඝයා තුළ පමණක් සිටිති.
(2) භික්ෂුණී සංඝයා තුළ පමණක් සිටිති.
(3) භික්ෂු-භික්ෂුණී උභතෝසංඝයා තුළ පමණක් සිටිති.
(4) උපාසක-උපාසිකා දෙපක්ෂය තුළ පමණක් සිටිති.
(5) සිවුවණක් පිරිස තුළ ම සිටිති.

13. සිගාලෝවාද සූත්‍රයෙහි සදිසා නියෝජනය වන පරිදි විවිධ සමාජ සංස්ථා හඳුන්වා දී තිබේ. දෙමවුපිය-දූදරු, ගුරු-සිසු, අඹු-සැමි, මිත්‍ර-කුලපුත්‍ර, ගිහි-පැවිදි, සේව්‍ය-සේවක යනු එම සමාජ සංස්ථා ය. මේ අනුව උතුරු දිසාවෙන් නියෝජනය වන සමාජ සංස්ථාව වන්නේ,
(1) දෙමවුපියෝ ය. (2) ආචාර්යවරු ය. (3) මිත්‍ර - කුලපුත්‍රයෝ ය.
(4) ශ්‍රමණ - බ්‍රාහ්මණයෝ ය. (5) සේව්‍ය - සේවකයෝ ය.

[ තුන්වෙනි පිටුව බලන්න.

14. සිගාලක ගෘහපති පුත්‍රයා විසින් අනුගමනය කරනු ලැබූ පිළිවෙතක් දුටු බුදුරදුන් ඒ වෙනුවට සමාජගත ජීවිතයේ දී පුද්ගලයා විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් සමුදයක් පෙන්වා දී ඇත. සමාජයේ යහපැවැත්මට හේතු වන එකී යුතුකම් අතුරෙන් පරම්පරාවෙන් උරුම වන සම්පත් රැක ගැනීම,

(1) දෙමව්පියන්ගේ වගකීමකි. (2) දරුවන්ගේ වගකීමකි.
(3) ස්වාමිපුරුෂයාගේ වගකීමකි. (4) බිරිඳගේ වගකීමකි.
(5) සේවකයන්ගේ වගකීමකි.

15. ගිහියෝ කාමභෝගීහු වෙති. කම්සැපයෙහි ඇලීම දුකට හේතුවන්නක් වුව ද ගෘහස්ථ ප්‍රතිපදාව තුළ ධාර්මික ව කම්සුව විඳීමට බුදුසමයෙන් බාධාවක් නැත. බුදුසමය එකඟ නො වන්නේ සාවද්‍ය ලෙස කම්සුව විඳීමට ය. ගිහි බෞද්ධයාට නිරවද්‍ය ලෙස කම්සැප විඳීම සඳහා අනුමැතිය පළ කොට ඇති ශික්ෂා පදය වන්නේ,

(1) මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං
(2) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං
(3) අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං
(4) කාමේසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං
(5) නච්චගීතවාදිතවිසූකදස්සනා වෙරමණී සික්ඛාපදං

16. හොඳ - නරක ක්‍රියා විනිශ්චය කිරීමේ මිනුම්දඬු ඇතැම් විට ඒ ඒ ආගම්වල වෙනස් ය. එක් ආගමක හොඳ ක්‍රියාවක් වෙනත් ආගමක හොඳ නො වන ක්‍රියාවක් විය හැකි ය. එහෙත් හොඳ - නරක ක්‍රියා තීරණය කිරීමේ බෞද්ධ නිර්ණායක ලෝකයේ යථාර්ථයට අනුරූප වේ. මෙය සිද්ධිවාචක බව යනුවෙන් ද හැඳින්වෙයි. මේ අනුව "පව් කරන පුද්ගලයාට තමා විසින් සිදු කළ පාපය පිළිබඳ රහසක් නැත. තමා කළ ක්‍රියා පිළිබඳ ව ඔහු පවසන දේ සත්‍යයක් ද, අසත්‍යයක්ද'යි ඔහුම දනියි." මෙම ප්‍රකාශයෙන් අවධාරණය කෙරෙන හොඳ - නරක විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායකය වන්නේ,

(1) නුවණැත්තන්ගෙන් විමසා හොඳ - නරක තීරණය කිරීම ය.
(2) ඕනෑම ආගමක් පිළිගත් හොඳයැයි සම්මත ක්‍රියා කිරීම ය.
(3) සිද්ධි වාචක වූ ක්‍රියා සිදු කිරීම ය.
(4) හෘදය සාක්ෂියට එකඟ ව ක්‍රියා කිරීම ය.
(5) ආත්මාර්ථයට හේතු නො වුන ද පරාර්ථය පිණිස ඉවහල් වේ නම් එම ක්‍රියා කිරීම ය.

17. පන්සිල් - අටසිල් - දසසිල් - දසකුසල් - දසපාරමිතා - දස පින්කිරියවත් යනාදී බෞද්ධයන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියක් බුදු දහමින් උගන්වා තිබේ. ඒ අනුව බෞද්ධයන් විසින් සදාචාර විරෝධී ක්‍රියා නො කළ යුතු බවත්, සදාචාරවත් ක්‍රියාවල යෙදිය යුතු බවත් අවධාරණය කෙරේ. මෙය සමාදාන හා විරති යනුවෙන් ද හැඳින්වේ. විරති සංඛ්‍යාවට ගැනෙන "අභිජ්ඣාවෙන් වැළකීම" යන සදාචාරාත්මක මානසික ක්‍රියාව ඇතුළත් වන්නේ,

(1) පංච ශීලය තුළ ය. (2) අෂ්ටාංග ශීලය තුළ ය.
(3) දශ ශීලය තුළ ය. (4) දශ පුණ්‍යක්‍රියා තුළ ය.
(5) දශ කුශලය තුළ ය.

18. ශ්‍රද්ධාව හා භක්තිය සමානාර්ථ පද දෙකක් ලෙසින් පෙනුන ද, එහි අර්ථය සම්පූර්ණයෙන් ම එකිනෙකට වෙනස් ය. භක්තිය යනු සත්‍ය ගවේෂණයකින් තොර ව විශ්වාස කිරීම, ඇදහීම, පිළිගැනීම යනාදී අර්ථ ගම්‍යමාන වන පදයකි. එහෙත් ශ්‍රද්ධාව යන පදයෙන් ඊට වඩා ගැඹුරු අර්ථයක් ගෙන දෙයි. බුදු දහමෙහි ශ්‍රද්ධාව, අමූලිකා සද්ධා සහ ආකාරවතී සද්ධා යනුවෙන් දෙපරිදි ව දක්වේ. ශ්‍රද්ධාව උපදවා ගැනීම නිර්වාණගාමී ප්‍රතිපදාවේ මූලික පියවර ලෙස ද, සසරින් එතෙරවීම සඳහා පදනමක් වන බව ද, ආධ්‍යාත්මික කෙතෙහි වපුරන බිජුවට ලෙස ද දක්වා තිබීමෙන් බුදුසමය ශ්‍රද්ධාව අගය කොට ඇති ආකාරය පැහැදිලි වෙයි. මෙහි ලා බුදුසමය ඇගයීමට ලක් කරනු ලබන්නේ,

(1) භක්තිය හා මිශ්‍ර වූ ශ්‍රද්ධාවයි.
(2) භක්තිය හා මිශ්‍ර වූ අමූලිකා ශ්‍රද්ධාවයි.
(3) සකාරණ වූ ආකාරවතී ශ්‍රද්ධාවයි.
(4) භක්තිය හා මිශ්‍ර වූ ආකාරවතී ශ්‍රද්ධාවයි.
(5) අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව මිශ්‍ර වූ භක්තියයි.

19. පියදස නමින් හැඳින්වුණු එක්තරා ව්‍යාපාරිකයෙක් ධන සම්පත් වැඩියෙන් උපයා ගැනීමෙන් ද, පරිභෝග කිරීමෙන් ද අතෘප්තිමත් ව ජීවත් විය. වස්තු කාමය කෙරෙහි බෙහෙවින් ලොල් වූ හෙතෙම ධනයෙන් තෘප්තිමත් වීම පිණිස වඩ වඩාත් උත්සුකව ක්‍රියා කෙළේ ය. පියදසගේ ජීවන රටාව අධ්‍යයනය කළ ගුණපාල බෞද්ධ පිළිවෙත් පුරන්නෙකි. පියදස සුමඟට යොමු කිරීමට සිතූ ගුණපාල නිතර නිතර ඔහු හමු වී සුහද ව සාකච්ඡා කරමින් "වස්තු කාමය හා ක්ලේශ කාමය මිනිසා දුකට හෙලන මාරයාගේ බන්ධනයක් බවත්, කාමුකයා රන් කහවනු වැස්සක් වැස්සත් සෑහීමට පත් නොවී මිය යන බවත්, තණ්හාවේ දාසයකු නොවීම බෞද්ධ පිළිවෙත විය යුතු බවත්, ලද දෙයින් සෑහීමට පත් වී සතුටින් ජීවත් වීමට උත්සාහ ගන්නා ලෙසත්" කරුණු පෙන්වා දුන්නේ ය. බෞද්ධ ඉගැන්වීමට අනුව පියදසගේ ක්‍රියාකාරිත්වයට පදනම් වූ මනෝභාවය වන්නේ,

(1) අප්පිච්ඡතාවයි. (2) මහිච්ඡතාවයි. (3) අප්පකිච්චතාවයි.
(4) බහුකිච්චතාවයි. (5) පාපිච්ඡතාවයි.

20. බෞද්ධ ඉගැන්වීමට අනුව 'සුඛ' යන්නෙන් දක්වෙන සැප ය සාමිස සුඛ නිරාමිස සුඛ යනුවෙන් දෙපරිදි වේ. භෞතික සැප සම්පත් විඳිමින් ප්‍රාර්ථනා බහුල ව ගෘහස්ථයා විසින් විඳිනු ලබන ලෞකික සැපය, සාමිස සුඛයයි. පැවිදි උතුමන් හා ආර්යයන් වහන්සේලා ලෞකික අපේක්ෂාවලින් තොරව අත්විඳින සුඛය නිරාමිස සුඛයයි. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ හා අනවජ්ජ සුඛ යන සිව් වැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහමේ දැක් වේ. මේ අතුරෙන් 'අත්ථි සුඛ' නමින් හැඳින්වෙන්නේ,
(1) ධාර්මික ව උපයාගත් සම්පත් තමා සතු ව ඇතැයි ලබන සතුටයි.
(2) ධාර්මික ව උපයාගත් සම්පත් අර්ථවත් ව වැය කරමින් මැනවින් පරිභෝග කරමියි ලබන සතුටයි.
(3) ධාර්මික ව උපයාගත් සම්පත් දානාදී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.
(4) ධාර්මික ව උපයාගත් සම්පත් පරිභෝග නො කොට රැස් කිරීමෙන් ලබන සතුටයි.
(5) ධාර්මික ව උපයාගත් සම්පත් සිය දූ පුතුන්ට බෙදා දී ලබන සතුටයි.

21. ගෘහස්ථ ජීවිතයක සාර්ථකත්වය සඳහා ආර්ථික සමෘද්ධිය අවශ්‍යතම සාධකයක් බව බුදු දහම පිළිගනී. උට්ඨාන සම්පදාවෙන් නිර්දේශ කරන්නේ අලස නො වී උත්සාහවත් ව, අප්‍රමාදී ව කටයුතු කොට ශක්තිමත් ආර්ථිකයක් ඇති කරගත යුතු ආකාරයයි. ආර්ථික සමෘද්ධිය සඳහා ධනාත්මක අවධානයක් යොමු කරන බුදුසමය ධනය ඉපැයීමට අදාළ ව අත්‍යවශ්‍ය වන ගුණාත්මක සීමා ද දක්වා තිබේ. එවැනි සීමා **දෙකක්** ලෙස සැලකිය හැක්කේ,
(1) අප්‍රමාදී බව හා උත්සාහයයි.
(2) ධාර්මිකත්වය හා අසාහසිකත්වයයි.
(3) අනලස්බව හා සත්‍යවාදී වීමයි.
(4) වෙළඳාමෙහි හා කෘෂිකර්මාන්තයෙහි යෙදීමයි.
(5) කායික ශ්‍රමය හා මානසික ශක්තිය යෙදවීමයි.

22. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කෙරෙන විවිධ අවස්ථා බෞද්ධ මූලාශ්‍රයවලින් හඳුනාගත හැකි ය. දීඝනිකායේ සක්කපඤ්හ සූත්‍රයේ, බුදුරදුන් පංචසිඛ නම් ගාන්ධර්වයාගේ ගායනයත්, වාදනයත්, ඇගයීමට ලක් කළ ආකාරය සඳහන් වේ. රහතන් වහන්සේලාත්, රහත් තෙරණින් වහන්සේලාත් සොබා සුන්දරත්වය අත් විඳි අයුරු ථේර - ථේරී ගාථාවල විස්තර වෙයි. මෙසේ බෞද්ධ මූලාශ්‍රයවලින් ප්‍රකට වන සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ,
(1) සුන්දරත්වය මත පදනම් ව ලබන ආශ්වාදයයි.
(2) සොබා දහමේ අසිරිය දැකීමෙන් ලබන ආශ්වාදයයි.
(3) උපාදාන ග්‍රහණයෙන් තොර ව ලබන ආශ්වාදයයි.
(4) පංචේන්ද්‍රිය පිණවීමෙන් ලබන ආශ්වාදයයි.
(5) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දැකීමෙන් ලබන ආශ්වාදයයි.

23. පෙදරේරුවකු වූ කරුණාදාස සිවුදරු පියෙකි. සිය දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හා ගෙදර-දොර අවශ්‍යතා සඳහා වැය කිරීමට ඔහුගේ ආදායම ප්‍රමාණවත් නොවී ය. එමනිසා ගෙවත්තේ එළවලු - පලතුරු වගාවක් ආරම්භ කළ කරුණාදාස පවුලේ පරිභෝජනයට අතිරේක ව ලැබුණු එළවලු - පලතුරු විකුණා අතිරේක ආදායමක් ද උපයා ගත්තේ ය. එම මුදල වැය කර කිරි එළදෙනක මිලට ගත් කරුණාදාස, සිය බිරිඳ හා දරුවන් තුළ වෙනද නොතිබුණු ප්‍රබෝධයක් ඇති බව දැක වඩාත් සතුටු විය. කාගේත් කැපවීම මත එළවලු පලතුරු හා ප්‍රමාණවත් කිරි නිෂ්පාදනයක් ලැබීම, පවුලේ වාසනාව උදා වීමක් විය. මේ ආකාරයට ගෘහස්ථ ආර්ථිකය සමෘද්ධිමත් කරගත් කරුණාදාස තම සම්පත් පින් දහම් කිරීමට, ඥාතීන්ට උපකාර කිරීමට ආදී යුතුකම් සඳහා ද වැය කෙළේ ය. ණය වී සම්පත් දියුණු කිරීමට අකමැති වූ ඔහු කිසිවිටෙකත් ණය ගැත්තකු නො වූ අතර අනාගතයේ දුෂ්කර අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීමට යම් මුදලක් ඉතිරි කිරීමට ද අමතක නො කෙළේ ය. මෙම සමස්ත ඡේදය දෙස අවධානය යොමු කිරීමේ දී, ගෘහස්ථ ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කළ කරුණාදාසගේ ජීවිත කථාවෙන් පැහැදිලිවන ප්‍රධාන කරුණ වන්නේ, ඔහු
(1) පෙදරේරුවකු හා ගොවියකු ලෙස සාර්ථක ව කටයුතු කළ බව ය.
(2) යුතුකම් ඉටු කිරීමට මැළි නො වූ බව ය.
(3) අනවශ්‍ය කටයුතු සඳහා මුදල් වැය නො කළ බව ය.
(4) ආර්ථික කළමනාකාරිත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කළ බව ය.
(5) බිරිඳගේ හා දරුවන්ගේ ඇප කැපවීම මත ආර්ථික සමෘද්ධිය උදාකරගත් බව ය.

24. දිළිඳුකම ගිහියන්ට දුකකි. සමාජ සදාචාර පරිහානිය සඳහා ද දිළිඳු බව බලපායි. බුදුසමයෙහි අවධාරණය කෙරෙන්නේ දැහැමි ව හා සාහසික නො වී ආර්ථික සමෘද්ධිය ළඟා කර ගත යුතු බව ය. කෘෂිකර්මාන්තය, වෙළඳාම, ගවපාලනය, රාජ්‍ය සේවය වැනි දැහැමි රැකියාවක යෙදී උත්සාහයෙන් ධන සම්පත් උපයා ගනිමින් ධනවතකු වීමට බුදු දහමින් බාධාවක් නැත. එසේ කිරීමේ දී තුලාකූට, කංසකූට, මානකූට, උක්කෝටන, වංචන ආදී අධාර්මික ක්‍රමවලින් වැළකිය යුතු බව නිර්දේශ කොට ඇත. මේ ඉගැන්වීමෙන් අදහස් කොට ඇත්තේ,
(1) වෙළඳාම් කටයුතු ධාර්මික ව කළ යුතු බව ය.
(2) පංචවිධ අධාර්මික වෙළඳාම්වලින් වැළකිය යුතු බව ය.
(3) වෙළඳාම මෙන් ම වෙනත් දැහැමි රැකියාවකින් මුදල් ඉපයීම බුදු සමය අනුමත කරන බව ය.
(4) දැහැමි ව එහෙත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ම වෙළඳාම් කළ යුතු බව ය.
(5) කෘෂිකර්මාන්තය ආදී දැහැමි රැකියාවක නිරත වීම සමාජ සේවයක් ලෙස සලකා සිදු කළ යුතු බව ය.

25. බෞද්ධයන්ගේ ඒකායන නිර්වාණගාමී මාර්ගය වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එය වනාහි ලෝකෝත්තර අභිවෘද්ධිය සඳහා ක්‍රියා කරන භික්ෂුවටත්, ලෞකික අභිවෘද්ධිය පතන ගිහියාටත් පොදු ය. මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දක්වෙන "සම්මා කම්මන්ත" යනුවෙන් අදහස් කෙරෙන්නේ,
(1) කායික - වාචසික දුශ්චරිතවලින් වෙන් වීම ය.
(2) කායික සදාචාරවත් බව රැක ගැනීම ය.
(3) දිවි පැවැත්ම සඳහා කරන වැරදිවලින් වැළකීම ය.
(4) තිදොරින් සිදුවන වැරදිවලින් වැළකීම ය.
(5) සාවද්‍ය කර්මාන්තවලින් වැළකී යහපත් කර්මාන්තවලින් මුදල් ඉපයීම ය.

26. සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ සය අවුරුද්දක් තිස්සේ පුගුණ කළ දුෂ්කර චර්යා ප්‍රතිපදාව අවසන් කෙළේ එමගින් තමන් බලාපොරොත්තු වූ විමුක්තිය ලබා ගැනීමට නො හැකි වූ බැවිනි. අනතුරු ව මැදුම් පිළිවෙත අනුගමනය කළ බෝසතාණෝ පළමු ව ආනාපානසතිය ද ඉන්පසු විදර්ශනාව ද වඩා 'ත්‍රිවිද්‍යා' නම් වූ සුවිශේෂී ඤාණ තුනක් උපදවා ගත්හ. එකී ත්‍රිවිද්‍යා ඥානයන්ට අයත් වන්නේ,
(1) පුබ්බේනිවාසානුස්සති, දිබ්බසෝත, ආසවක්ඛය ඤාණයන් ය.
(2) පුබ්බේනිවාසානුස්සති, ආසවක්ඛය, සබ්බඤ්ඤුත ඤාණයන් ය.
(3) පුබ්බේනිවාසානුස්සති, දිබ්බචක්ඛු, චතු වේසාරජ්ජ ඤාණයන් ය.
(4) පුබ්බේනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය ඤාණයන් ය.
(5) පුබ්බේනිවාසානුස්සති, දිබ්බචක්ඛු, දිබ්බසෝත ඤාණයන් ය.

27. පන්සාළිස් වසක් මුළුල්ලේ දෙවි- මිනිසුන්ගේ හිත සුව පිණිස ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන් සදාචාර සම්පන්න කොට නිවන් මගට යොමු කිරීමට විවිධ ක්‍රමවේද අනුගමනය කළහ. හුදෙක් අනුශාසකයකු ලෙස පමණක් ක්‍රියා නො කළ උන්වහන්සේ හැමවිට ම ආදර්ශ සම්පන්න ද වූහ. පිවිතුරු චරිතයකින් යුක්ත වීම, විනිවිදභාවයෙන් කටයුතු කිරීම, විමසීමට හා විචාරයට ඉඩ සැලසීම, ශ්‍රාවකයන් පිළිබඳ නිරන්තර අවධානය හා ඔවුන්ගේ සුවිශේෂ කුශලතා හඳුනාගැනීම, සුදුස්සාට සුදුසු වගකීම් පවරා දීම ආදිය උන්වහන්සේ තුළ පැවැති විශිෂ්ට ශාස්තෘ ගුණාංගයෝ වෙති. සමස්තයක් ලෙස ඉහත ඡේදයෙන් පෙනෙන්නේ,
(1) බුදුරදුන් ශ්‍රාවකයන් විෂයයෙහි ප්‍රකට කළ මහා කරුණා ගුණයයි.
(2) බුදුරදුන් තුළ පැවැති ආගමික සහනශීලීත්වයයි.
(3) බුදුරදුන් තුළ පැවැති විශිෂ්ට නායකත්වයයි.
(4) බුදුරදුන් තුළ පැවැති යථාවාදී තථාකාරී ගුණයයි.
(5) බුදුරදුන් තුළ පැවැති ධර්මප්‍රචාරය කිරීමේ විශේෂ හැකියාවයි.

28. ධර්ම කරුණු හා ගැටලු, මැනවින් පැහැදිලි කිරීමේ අතිදක්ෂයෙක් වූ බුදුරජාණන් වහන්සේ දහම් දෙසීමේ දී විවිධ උපාය උපක්‍රම භාවිත කළහ. සරල ව, නිරවුල් ව මැනවින් බස හැසිර වූ උන්වහන්සේ අත්තජ්ඣාසය, පරජ්-ඣාසය, අට්ඨුප්පත්තික, පුච්ඡාවසික යන ක්‍රමවේද භාවිත කරමින් දහම් දෙසූ හ. තමන් වෙත එළඹෙන ගැටලුවලට පිළිතුරු දීම සඳහා යොදගත් තවත් ක්‍රමවේදයක් ඒකංසබ්‍යාකරණීය, පටිපුච්ඡාබ්‍යාකරණීය, විභජ්ජබ්‍යාකරණීය හා ඨපනීය යනුවෙන් ද විස්තර වේ. මෙහි පටිපුච්ඡාබ්‍යාකරණීය යනුවෙන් අදහස් වන්නේ,
(1) අසන ලද ප්‍රශ්නයට ඍජු පිළිතුරක් දීම ය.
(2) අසන ලද ප්‍රශ්නය විශ්ලේෂණය කොට පිළිතුරු දීම ය.
(3) අසන ලද ප්‍රශ්නයට පිළිතුරු නො දී පසෙකින් තැබීම ය.
(4) අසන ලද ප්‍රශ්නය ප්‍රතිප්‍රශ්නයක් මගින් පැහැදිලි කරගෙන පිළිතුරු දීම ය.
(5) අසන ලද ප්‍රශ්නය උපමා-රූපක-නිදර්ශන මගින් පැහැදිලි කර දීම ය.

29. බුදුරජාණන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළ බව ඇසූ එගම් වැසි නායක බමුණෙක් බුදුන් දකින්නට යාමට සූදනම් විය. ඔහුගේ සහචර බමුණෝ පන්සියයක් දෙනා ම බුදුන් දකින්නට යාම ඔහු වැනි නායක බමුණකුට තරම් නොවේ යැයි ප්‍රකාශ කළහ. එහි දී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටුව බුදුරදුන් වෙත පැමිණියේ ය. මෙසේ බුදුරදුන්ගේ ගුණ ගැයූ බමුණා වූයේ,
(1) අග්ගිකභාරද්වාජ ය.
(2) කසීභාරද්වාජ ය.
(3) සුන්දරිකභාරද්වාජ ය.
(4) අක්කෝසකභාරද්වාජ ය.
(5) සෝණදණ්ඩ ය.

30. බුද්ධකාලීන භාරතයේ ව්‍යාප්ත ව තිබූ බ්‍රාහ්මණ සංස්කෘතියට අමතර ව විවිධ ආගමික ව්‍රත, චර්යා අනුගමනය කළ පැවිද්දෝ වූහ. මොවුන් ආජීවක, පරිව්‍රාජික, අචේලක, නිගණ්ඨ, ඒකසාටක, ජටිල ආදී නම්වලින් හැඳින් වූ බව පෙනේ. ඇතැම් ශ්‍රමණයෝ දුෂ්කර ව්‍රත අනුගමනය කළ අත්තකිලමථානුයෝගීහු වූහ. මේ අතර බුදුරජාණන් වහන්සේ ගොඩනැගූ පැවිදි සංවිධානය 'ශාක්‍යපුත්‍ර ශ්‍රමණ' නම් විය. මේ අනුව බුද්ධ කාලීන භාරතයේ පැවැති මුඛ්‍යතම ආගමික සම්ප්‍රදාය දෙක හඳුන්වනු ලබන්නේ
(1) බෞද්ධ හා නිගණ්ඨ යනුවෙනි.
(2) බෞද්ධ හා පරිබ්‍රාජක යනුවෙනි.
(3) නිගණ්ඨ හා ආජීවක යනුවෙනි.
(4) ශ්‍රමණ හා බ්‍රාහ්මණ යනුවෙනි.
(5) ආජීවක හා ජටිල යනුවෙනි.

31. සම්බුද්ධත්වයෙන් විසි වසරකට පසුව භික්ෂූන් උදෙසා විනය ශික්ෂාපද පනවන්නට සිදු වූ බව බෞද්ධ මූලාශ්‍රයවල දක්වේ. භික්ෂූන් තුළ ආසවට්ඨානීය ධර්ම පහළවීමත්, භික්ෂූන්තුළ සද්ධර්මය අතුරුදන් වීමත් හේතු කොට ගෙන විනය ශික්ෂාපද පැනවීමට සිදු විය. මෙසේ ක්‍රමයෙන් වර්ධනය වූ විනය ශික්ෂා, ආදිබ්‍රහ්මචරියක ශික්ෂා සහ ආභිසමාචාරික ශික්ෂා යනුවෙන් දෙ කොටසකට බෙදිණි. මෙයින් සප්ත අධිකරණ සමථ ධර්ම හැර ආදිබ්‍රහ්මචරියක ශික්ෂා ගණයට අයත්, භික්ෂුවට අදාළ ශික්ෂා පද සංඛ්‍යාව වන්නේ,
(1) දෙසිය විස්සකි. (2) දෙසිය විසි හතකි. (3) දෙසිය තිස් හතරකි.
(4) තුන්සිය හතරකි. (5) තුන්සිය එකොළොසකි.

32. බෞද්ධ ශාසනික සම්ප්‍රදාය තුළ භාවිත වූ උපසම්පද ක්‍රම අටක් පිළිබඳ තොරතුරු හමු වේ. ඒහිභික්ඛු - තිසි සරණාගමන - ඕවාදපටිග්ගහණ, - පඤ්හබ්‍යාකරණ, - අට්ඨවාචික - දූතේන - අට්ඨගරුධම්මපටිග්ගහණ - ඤත්තිචතුත්ථකම්ම යනු එකී උපසම්පද ක්‍රම අටයි. මෙයින් සමහරක් එක් අවස්ථාවක දී පමණක් භාවිත වූ අතර සමහරක් දීර්ඝ කාලයක් තිස්සේ භාවිතයට ගෙන තිබේ. අට්ඨගරුධම්මපටිග්ගහණ උපසම්පද ක්‍රමයෙන් උපසම්පදාව ලැබුවේ,
(1) මහා ප්‍රජාපතී ගෝතමිය සහ පන්සියයක් ශාක්‍ය වංශික කාන්තාවන් පමණි.
(2) මහා ප්‍රජාපතී ගෝතමිය සහ යසෝධරා පමණි.
(3) මහා ප්‍රජාපතී ගෝතමිය පමණි.
(4) උප්පලවණ්ණා පමණි.
(5) බුදුරදුන් වෙතින් උපසම්පදාව ලැබූ සියලු ම භික්ෂුණීන් වහන්සේලා පමණි.

33. බෞද්ධ සංඝ සංස්ථාව ආරම්භ වූ මුල් යුගයේ දී සසුන් ගත වූවන්ගේ ඒකායන අභිප්‍රාය වූයේ නිර්වාණාධිගමය කොට සසර දුකින් මිදීම ය. මෙකල භික්ෂූන්ට විනය ශික්ෂා පැනවීමේ අවශ්‍යතාවක් පැන නො නැගුණි. භික්ෂූන් බුද්ධ දේශිත ධර්මය සිය සංවරය සඳහා ප්‍රමාණ කොට ගත්හ. මීට අමතර ව එම යුගයේ භික්ෂූන්ගේ ස්වයං සංවරය පිණිස ඉවහල් වූ බුද්ධානුශාසනාවක් වූයේ,
(1) භික්ෂු ප්‍රාතිමෝක්ෂයයි. (2) ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.
(3) උභය ප්‍රාතිමෝක්ෂයයි. (4) පාතිමොක්ඛුද්දේසයයි.
(5) උපෝසථ කර්මයයි.

34. සිය අනුගාමිකයන්ගේ විශේෂ දක්ෂතා හා හැකියා හඳුනාගැනීම, නායකයකු තුළ තිබිය යුතු උසස් ගුණාංගයකි. මෙම නායකත්ව ලක්ෂණය බුදු සිරිතෙන් මැනවින් ප්‍රකට වේ. ඒ ඒ ක්ෂේත්‍රවල සුවිශේෂ හැකියා මතුකර ගත් ශ්‍රාවකයන්ට බුදුරදුන් විසින් අදාළ ක්ෂේත්‍රවල අග තනතුරු පිරිනැමූ බව අංගුත්තර නිකායේ ඒතදග්ගපාළියෙහි පැහැදිලි ව සඳහන් වේ. ඒ අනුව ධර්මකථිකයන් අතුරෙන් අගතනතුරට පත් වූයේ,
(1) මහා කච්චාන හිමියන් ය. (2) සාරිපුත්ත හිමියන් ය.
(3) මහා කාශ්‍යප හිමියන් ය. (4) අනුරුද්ධ හිමියන් ය.
(5) මන්තානිපුත්ත පුණ්ණ හිමියන් ය.

35. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට තෝරාගත් නගරය වූයේ,
(1) රජගහ නුවර ය. (2) කුසිනාරා නුවර ය. (3) සැවැත් නුවර ය.
(4) පැළලුප් නුවර ය. (5) විශාලා මහනුවර ය.

36. තමන් වහන්සේගේ ඇවෑමෙන් ඛුද්දා - අනුඛුද්දා ශික්ෂාපද භික්ෂූන්ට අවශ්‍ය නම් සමූහනය කළ හැකි යැයි බුදුරජාණන් වහන්සේ අවසර දුන් බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ. මේ ගැටලුව ප්‍රථම ධර්ම සංගීතියේ දී මතු වූ නමුත් ඉන් අදහස් කෙරෙන්නේ කුමන ශික්ෂා පද දැයි තීරණයකර ගැනීමට නො හැකි විය. එහෙයින් ඛුද්දා - අනුඛුද්දා ශික්ෂා පද තීරණය නො කොට, බුදුරදුන් විසින් පනවන ලද සියලු ම ශික්ෂාපද ඒ ආකාරයෙන් ම පවත්වා ගෙන යාම සුදුසු යැයි යෝජනා කරන ලද්දේ,
(1) උපාලි හිමියන් විසිනි. (2) ආනන්ද හිමියන් විසිනි.
(3) මහා කාශ්‍යප හිමියන් විසිනි. (4) අනුරුද්ධ හිමියන් විසිනි.
(5) සාරිපුත්ත හිමියන් විසිනි.

37. ථේරවාදී මූලාශ්‍රයවලට අනුව වජ්ජිපුත්තක භික්ෂූන් විසින් අකැප කරුණු දහයක් කැපයයි සම්මත කොටගෙන විනය විරෝධී ව ක්‍රියා කිරීම නිසා දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට සිදු විය. වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් කැපයයි සම්මත කොටගෙන තිබූ 'කප්පති ජලෝගිපාතුං' යන්නෙන් අදහස් කරන ලද්දේ,
(1) කිරිත් නො වූ දීකිරිත් නො වූ කිරි අවේලාවේ බීම කැප බවයි.
(2) අතිරික්ත භෝජනය අවේලාවේ වැළඳීම කැප බවයි.
(3) අහක තබාගෙන ලුණු අවශ්‍ය විටෙක පාවිච්චි කිරීම කැප බවයි.
(4) හිරු අවරට ගොස් අවච්ඡායාව දඟුලක් ගතවන තුරු ආහාර ගැනීම කැප බවයි.
(5) නො පැසුණු සුරා පානය කිරීම කැප බවයි.

38. ආරාමය පදනම් කරගත් බෞද්ධ අධ්‍යාපනයේ ස්වර්ණමය යුගය ඇරඹෙන්නේ බෞද්ධ විශ්වවිද්‍යාල බිහිවීමත් සමඟ ය. නාලන්ද, වික්‍රමශිලා, වලභි, ඕදන්තපුරි, ජගද්දලා එවැනි සුප්‍රකට බෞද්ධ විශ්වවිද්‍යාල ලෙස සැලකේ. ලොව පැරණිතම විශ්වවිද්‍යාලය ලෙස සැලකෙන තක්ෂිලා විශ්වවිද්‍යාලය මෑතක් වන තුරු ම බෞද්ධ විශ්වවිද්‍යාලයක් ලෙස නො පිළිගැනුන ද පුරා විද්‍යාත්මක කැණීම්වලින් සහ එම ප්‍රදේශයේ විසිරි පවත්නා විශාල ප්‍රමාණයක් වූ බෞද්ධ නටබුන්වලින් තක්ෂිලාව ද බෞද්ධ විශ්වවිද්‍යාලයක් ව පැවැති බව තහවුරු වී ඇත. තක්ෂිලා විශ්වවිද්‍යාලය වර්තමානයේ අයත් ව ඇත්තේ,
(1) ඉන්දියාවට ය.　(2) පාකිස්ථානයට ය.　(3) ඇෆ්ගනිස්ථානයට ය.
(4) ඉරානයට ය.　(5) නේපාලයට ය.

39. ආදර්ශවත් බෞද්ධ රාජ්‍යපාලකයකු වූ ධර්මාශෝක අධිරාජයා එකල භාරතයේ පැවැති සියලු ම ආගම්වලට ගෞරව කෙළේ ය. බුදුසමය විෂයයෙහි සුවිශේෂී සැලකිල්ලක් දක් වූ ඔහු බෞද්ධ අධිරාජයකු ලෙස විශ්ව කීර්තියට පත්විය. ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ අශෝක රජු උපතින්,
(1) බෞද්ධයෙක් විය.　(2) හින්දු භක්තිකයෙක් විය.
(3) ජෛන භක්තිකයෙක් විය.　(4) ආජීවක භක්තිකයෙක් විය.
(5) බ්‍රාහ්මණ භක්තිකයෙක් විය.

40. බුදුසසුනේ සංරක්ෂණයට හා චිරස්ථිතියට පුරාණ භාරතීය නරපතියන් විසින් සිදුකොට ඇති මෙහෙය පුරාවිද්‍යා සාධකවලින් හා ඓතිහාසික වාර්තාවලින් පැහැදිලි වෙයි. ධර්ම සංගායනාවලට අනුග්‍රහය දක්වීමෙන් ද, විදෙස් රටවලට බුදුසමය හඳුන්වා දීමෙන් ද සිදු කළ ශාසනික මෙහෙවර අගය කළ යුතු ය. කාෂ්මීරයේ කුණ්ඩලවන විහාරයේ දී පැවැත් වූ ධර්ම සංගායනාවට අනුග්‍රහය දක්වන ලද්දේ ද එවැනි බෞද්ධ නරපතියකු විසිනි. මධ්‍ය ආසියාව තුළ බුදු දහම ව්‍යාප්ත කිරීමට ද වෙහෙසුණු හෙතෙම,
(1) කාලාශෝක රජතුමා ය.　(2) ධර්මාශෝක රජතුමා ය.
(3) චන්ද්‍රගුප්ත රජතුමා ය.　(4) ශක්‍රාදිත්‍ය රජතුමා ය.
(5) කණිෂ්ක රජතුමා ය.

41. ප්‍රාග් බෞද්ධ ලංකාවේ විවිධ ආගමික ඇදහිලි, විශ්වාස පැවැති බව ඓතිහාසික වාර්තාවල දක්වේ. යක්ෂයන් හා යක්ෂණියන් ඇදහීම ද ඒ අතර විය. විශේෂයෙන් පණ්ඩුකාභය රාජ්‍ය සමයේ යක්ෂ වන්දනාව ජනප්‍රිය වී තිබුණු අතර රජුගේ ගෙළයන සීමාවේ ම දෙවොලක් තනවා වාර්ෂික ව පුද පූජා උත්සව පවත්වන ලද බව මහාවංශයේ සඳහන් වෙයි. එම දෙවොලට අධිපති වූයේ,
(1) චිත්තරාජ යක්ෂයා ය.　(2) කාලවේල යක්ෂයා ය.
(3) මහේජ යක්ෂයා ය.　(4) වලවාමුඛී යක්ෂණිය ය.
(5) චිත්තා යක්ෂණිය ය.

42. වට්ටගාමිණීඅභය, වෝහාරිකතිස්ස, ගෝඨාභය, මහසෙන්, පළමුවන සේන යන රාජ්‍ය සමයන් තුළ භාරතයේ ජනප්‍රිය වී තිබුණු විවිධ බෞද්ධ නිකායික ඉගැන්වීම් මෙරටට ගෙනැවිත් තිබේ. එවැනි එක් ඉගැන්වීමකි, වෛතුල්‍ය වාදය. ශ්‍රී ලාංකික භික්ෂු සමාජය තුළ විශාල අර්බුදයක් ඇති කළ වෛතුල්‍යවාදී ඉගැන්වීම් ජනප්‍රිය කරවීමට මෙරට ඇතැම් පාලකයන් ද සහාය දී තිබේ. ඊට එරෙහි ව දැඩි පියවර ගෙන වෛතුල්‍ය වාදය මැඩ පැවැත් වූ පාලකයකු ලෙස ප්‍රකට වන්නේ,
(1) වට්ටගාමිණීඅභය රජු ය.　(2) මහසෙන් රජු ය.　(3) ගෝඨාභය රජු ය.
(4) පළමුවන සේන රජු ය.　(5) දුටුගැමුණු රජු ය.

43. ථේරවාදී බෞද්ධ රටවල භික්ෂු සංස්ථාව පිරිහී ගිය යුගවල වෙනත් බෞද්ධ රටවලින් ලැබුණු ශාසනික අනුග්‍රහයන් හේතුකොට ගෙන නැවත උපසම්පදාව පිහිටුවා භික්ෂු සංස්ථාව ප්‍රතිෂ්ඨාපනය කිරීමට හැකි විය. ඒ අනුව ථායිලන්තය, බුරුමය හා ශ්‍රී ලංකාව අතර මෙන් ම චීනය වැනි මහායාන බෞද්ධ රටවල් සමඟ ද ශාසනික කාර්ය හුවමාරු කරගත් අවස්ථා බොහෝ ය. 'සීහල සංඝ' නමින් හැඳින්වෙන්නේ මෙසේ හුවමාරු කර ගන්නා ලද ශාසනික සහයෝගීතාවේ එක් ප්‍රතිඵලයක් ලෙස බිහි වූ බෞද්ධ නිකායකි. මෙය වනාහි,
(1) ශ්‍රී ලංකාවෙන් බුරුමයට හඳුන්වා දෙන ලද නිකායකි.
(2) ශ්‍රී ලංකාවෙන් ථායිලන්තයට හඳුන්වා දෙන ලද නිකායකි.
(3) ශ්‍රී ලංකාවෙන් චීනයට හඳුන්වා දෙන ලද නිකායකි.
(4) බුරුමයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද නිකායකි.
(5) ථායිලන්තයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද නිකායකි.

44. 'ධම්මයුක්තික නිකාය' සහ 'මහා නිකාය' යනුවෙන් දැක්වෙන්නේ,
(1) ථායිලන්තයේ ප්‍රචලිත ව පැවැති ප්‍රධාන බෞද්ධ නිකාය දෙක ය.
(2) මියන්මාරයේ ප්‍රචලිත ව පැවැති ප්‍රධාන බෞද්ධ නිකාය දෙක ය.
(3) කාශ්මීර ගන්ධාර ප්‍රදේශයේ ප්‍රචලිත ව පැවැති ප්‍රධාන බෞද්ධ නිකාය දෙක ය.
(4) චීනයේ ප්‍රචලිත ව පැවැති ප්‍රධාන බෞද්ධ නිකාය දෙක ය.
(5) ජපානයේ ප්‍රචලිත ව පැවැති ප්‍රධාන බෞද්ධ නිකාය දෙක ය.

[ අටවෙනි පිටුව බලන්න.

45. 'චාන්' හෙවත් ධ්‍යාන නමින් ප්‍රසිද්ධ බෞද්ධ භාවනා ක්‍රමය හඳුන්වා දෙමින් චීන ජනයාගේ ආධ්‍යාත්මික ශක්තිය පුබුදු කිරීමට ක්‍රියා කළ භාරතීය මහතෙරුන් වහන්සේ වූයේ,
(1) කුමාරජීව හිමියන් ය.
(2) බෝධිධර්ම හිමියන් ය.
(3) පරමාර්ථ හිමියන් ය.
(4) කාශ්‍යප මාතංග හිමියන් ය.
(5) ධර්මරක්ෂ හිමියන් ය.

46. ජපන් ජාතිකයන් විසින් මහත් හරසරින් පවත්වනු ලබන උත්සවයක් ලෙස 'හනමත්සුරි' හෙවත් මල් උත්සවය හඳුන්වා දිය හැකි ය. මෙම උත්සවය පවත්වනු ලබන්නේ,
(1) සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිහි කිරීමට ය.
(2) ශාක්‍ය මුනි බුදුරදුන්ගේ සම්බුද්ධත්වය සිහිකිරීමට ය.
(3) ශාක්‍ය මුනි බුදුරදුන්ගේ පරිනිර්වාණය සිහිකිරීමට ය.
(4) අමිතාභ බුදුරදුන්ගේ ගුණ කදම්බය සිහිකිරීමට ය.
(5) මියගිය සියලු ඥතීන් සිහිකිරීමට ය.

47. 'නෙම්බුත්සු' යනු ජපන් ජාතික 'ජෝදෝ' සහ 'ජෝදෝ ෂිං' නිකායික අනුගාමිකයන් විසින් සිදු කරනු ලබන ජනප්‍රිය වන්දනාවකි. මෙහි දී වන්දනාවට පාත්‍රවන්නේ,
(1) ශාක්‍යමුනි බුදුරදුන් ය.
(2) භෛෂජ්‍යගුරු බුදුරදුන් ය.
(3) වෛරෝචන බුදුරදුන් ය.
(4) අමිතාභ බුදුරදුන් ය.
(5) අවලෝකිතේශ්වර බෝසතුන් ය.

48. ක්‍රි.පූ. පළමු වන සියවසේ හෝ ක්‍රි.ව. පළමු වන සියවසේ දී පමණ බුදුරදුන් මානවරූපී ව නිර්මාණය කිරීමට කලාකරුවන් පෙලඹී ඇති බව පිළිගැණේ. ගන්ධාර, මථුරා, අමරාවතී යන කලා සම්ප්‍රදාය මේ පිළිබඳ ව උනන්දු වී ඇත. ගන්ධාර සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමාවල මථුරා සම්ප්‍රදායයේ බුද්ධ ප්‍රතිමාවලට සාපේක්ෂ ව දක්නට ලැබෙන සුවිශේෂී වෙනස්කමක් වන්නේ,
(1) දෙනෙත් අඩවන් ව තිබීම ය.
(2) තොල් මහත් ව තිබීම ය.
(3) කම්මුල් පිරී තිබීම ය.
(4) හිසකෙස් කැරළි ගැසී තිබීම ය.
(5) පද්මාසනය මත සෘජු සිරුරකින් යුතු ව නිමවා තිබීම ය.

49. ස්තූපය වටා ගෘහයක් තැනීම් වශයෙන් ආරම්භ වූ ගෘහ නිර්මාණ විශේෂයක් භාරතයේ දී චෛත්‍යශාලා නමින් හැඳින්විණි. මෙහි ආභාසය ලැබූ ශ්‍රී ලාංකික කලා ශිල්පීන් ද දේශීය අනන්‍යත්වය ද රැකගනිමින් ස්තූප ගෘහයක් නිර්මාණය කර ඇත. එම කලා නිර්මාණය හඳුන්වන්නේ,
(1) අට ද ගේ යනුවෙනි
(2) වට ද ගේ යනුවෙනි
(3) හැට ද ගේ යනුවෙනි
(4) ගෙඩි ගේ යනුවෙනි
(5) පාසාද යනුවෙනි.

50. ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වා දීමෙන් අනතුරු ව මෙරට කලා ශිල්ප, භාෂා සාහිත්‍යාදී විවිධ ක්ෂේත්‍ර විෂයයෙහි බුදුසමයේ ආභාසය නොඅඩුව ලැබුණි. විශේෂයෙන් ම ගද්‍ය-පද්‍ය සාහිත්‍ය රචනා කිරීමෙහි ලා ජාතක කථා වස්තු විෂයය වී ඇති බව දක්නට ලැබේ. බණ මගක් අනුගමනය කරමින් රචනා වූ කාව්‍යශේඛරය නම් වූ මහා කාව්‍යය නිර්මාණය කිරීමෙහි ලා පාදක වී ඇත්තේ,
(1) මඛාදේව ජාතකයයි.
(2) උම්මග්ග ජාතකයයි.
(3) වෙස්සන්තර ජාතකයයි.
(4) සත්තුභත්ත ජාතකයයි.
(5) කුස ජාතකයයි.

* * *

40260

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

1. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව වෛශ්‍ය වර්ණයට නියමිත 'ස්වධර්ම' නම් කරන්න.
   (ii) වෛදික සාහිත්‍යයේ දක්වෙන 'ආශ්‍රමධර්ම' හඳුන්වා දෙන්න.
   (iii) චතුර් වර්ණයේ ඓතිහාසික ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ගෙනහැර දක්වන්න.
   (iv) බෞද්ධ ඉගැන්වීම් අනුව ආධ්‍යාත්මික සුවය පිණිස කුලහීනත්වය කිසිදු බාධාවක් **නො වන** බව උදාහරණ **දෙකක්** මගින් පෙන්වා දෙන්න.
   (v) පවුල් සංස්ථාව තුළ කාන්තාවට බුදු දහමින් හිමි කර දුන් ගෞරවණීය තත්ත්වය පැහැදිලි කරන්න.

2. (i) අජිතකේසකම්බිලි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
   (ii) අජිතකේසකම්බිලි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය ඉදිරිපත් කරන්න.
   (iii) බ්‍රාහ්මණ සම්ප්‍රදායයෙන් ශ්‍රමණ සම්ප්‍රදායය වෙන් කොට හඳුනාගත හැකි අනන්‍යතා ලක්ෂණ **පහක්** නම් කරන්න.
   (iv) ක්‍රි.පූ. හයවැනි සියවස වනවිට භාරතීය සමාජය නාගරීකරණයට ලක්වෙමින් පැවැති බවට සාධක **පහක්** පෙන්වා දෙන්න.
   (v) බුද්ධ කාලීන භාරතීය පාලකයන් හා බුදුරදුන් අතර පැවැති සම්බන්ධතා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

3. (i) දස සක්විති වත් හඳුන්වන්න.
   (ii) මනා රාජ්‍ය පාලනයක් සඳහා සතර සංග්‍රහ වස්තුවල උපයෝගීතාව පැහැදිලි කරන්න.
   (iii) සිගාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය-සේවක යුතුකම් හා වගකීම් ගෙනහැර දක්වන්න.
   (iv) දස අකුසල් පිළිවෙළින් නම් කරන්න.
   (v) 'අත්තූපනායික ධර්ම පර්යාය' යනු කුමක්ද'යි හඳුන්වාදෙන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

4. (i) ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස කෙටියෙන් දක්වා බුදුසමයේ ඇගයීමට ලක් වන්නේ කවරාකාරයේ ශ්‍රද්ධාවක්ද'යි පෙන්වා දෙන්න.
   (ii) නූතන සමාජ ගැටලු අවම කර ගැනීම සඳහා පංච ශීල ප්‍රතිපදාව උපයෝගී කරගත හැකි ආකාරය උදාහරණ සහිත ව විස්තර කරන්න.
   (iii) වර්තමාන ආර්ථික අර්බුද පිළිබඳ ව අවධානය යොමු කරමින් ආර්ථික සුරක්ෂිතතාව සඳහා අදාළ වන බෞද්ධ ආර්ථික සංකල්ප හඳුන්වා දෙන්න.
   (iv) සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

5. (i) බුදු සිරිතෙන් ප්‍රකට වන 'තාදීගුණය' නිදසුන් දෙමින් විස්තර කරන්න.
   (ii) ධර්මය සන්නිවේදනය කිරීමෙහි ලා බුදුරදුන් අනුගමනය කළ ක්‍රමෝපායයන් සනිදර්ශන ව පැහැදිලි කරන්න.
   (iii) නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මානව වර්ගයාගේ ප්‍රගමණයට හේතු වන ආකාරය පෙන්වා දෙන්න.
   (iv) වස් විසීමේ චාරිත්‍රයෙහි ආරම්භය හා විකාශය පැහැදිලි කරමින් ශාසනික පරමාර්ථ සාධනයෙහි ලා ඉන් ලැබෙන අනුබලය විස්තර කරන්න.

[ දෙවැනි පිටුව බලන්න.

6. (i) බුද්ධ කාලීන භාරතය තුළ බුදු දහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම කෙරෙහි භික්ෂු-භික්ෂුණී ශ්‍රාවකයන්ගෙන් ලැබුණු අනුග්‍රහය උදාහරණ මගින් පැහැදිලි කරන්න.
(ii) බුදුසසුනේ යහපැවැත්මට හා ව්‍යාප්තියට තෘතීය සංගීතියේ දී ගනුලැබූ තීරණ ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.
(iii) කණිෂ්ක රජු විසින් සිදු කරන ලද ශාසනික මෙහෙවර ඇගයීමට ලක් කරන්න.
(iv) ශ්‍රී ලංකා - ථායි ශාසනික සම්බන්ධතා දෙ රටේ බෞද්ධ සංස්කෘතික පුනර්ජීවයට දායක වී ඇති ආකාරය විමර්ශනය කරන්න.

7. (i) ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති ජන ඇදහිලි හා විශ්වාස ඓතිහාසික මූලාශ්‍රය නයින් පෙන්වා දෙන්න.
(ii) මිහිඳු මාහිමියන්ගේ ධර්මදූත ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ අතිශයින් ම සාර්ථක වීමට ඉවහල් වූ හේතු සාධක විමර්ශනය කරන්න.
(iii) අභයගිරි විහාරය කේන්ද්‍රකොට ගෙන ලාංකේය බෞද්ධ සංස්කෘතියට එක් වූ නව සංස්කෘතිකාංග හඳුන්වා දෙන්න.
(iv) මහාවිහාරයීය භික්ෂු සංඝයාගෙන් ඉටු වූ ජාතික මෙහෙවර ඇගයීමට ලක් කරන්න.

8. (i) බෞද්ධ ස්තූපකරණය බුද්ධකාලයේ දී ම ආරම්භ වූ බවට බෞද්ධ සාහිත්‍යයෙන් දක්විය හැකි සාධක පෙන්වා දෙන්න.
(ii) අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමාවලට සාපේක්ෂ ව පොළොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන සුවිශේෂතා පැහැදිලි කරන්න.
(iii) සඳකඩපහණෙහි කැටයම්වලින් නිරූපිත සංකේතාර්ථ විවරණය කරන්න.
(iv) පැරණි සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදුසමයෙන් ලැබුණු ආලෝකය සනිදර්ශන ව විස්තර කරන්න.

***